Page 7 Aug-Sep 2012.qxd 24/09/2012 14:23 Page 1



## නිශාකුමරි ඇවිදින්

සේද සිනිඳු සළු එළලා
මුදු යහන හැඩ කරලා
රට වඩින සඳු දැකලා
මැත දිනිඳු නිදි කිරලා

වවුල් සෙනග නිදි අතහැර
පියා හඹා යති බෝ දුර
ගෙන සඳු දෙව්ගෙන් අවසර
නිදති නෙළුම් මල් පුවතර

පවන් හමාවිත් කොඳුරන
වදන් අසා බස් මුමුණන
ගසුත් වැලුත් අත් බැඳගෙන
රඟන රුහුම් නෙත් අලවන

♦ **මධුෂිකා කල්පනී**
ජනාධිපති විද්‍යාලය
මිනුවන්ගොඩ Sri Lanka

## පලතුරු වාරය ඇවිත්


ජම්බු ගහම රතුපාටයි
මිදි වැල්වල ගෙඩි බරවෙයි
දොඩම් ගහේ අතු බරවෙයි
පළතුරු වාරය පැමිණෙයි

පේර ගසෙත් ගෙඩි පිරිල
රඹුටන් ගස බිමට නැමිල
වෙරළු ගසේ මල් පිපිල
පළතුරු වාරය ඇවිල්ල

පුංචි ළමයි සැම සතුටින්
අඹ ගස් යට දුව පනිමින්
ජම්බු පේර මිදි කඩමින්
මුව පුරවා ගති සුතුටින්

♦ **සමාධි නිමේෂා සංදිපනී**
*විශාකා බාලිකා විද්‍යාලය*
*බණ්ඩාරවෙල* Sri Lanka

**Send your poetry and short essays to this Children's Corner by post, fax or e-mail. ඔබෙ ලිපි හා කවි තැපෑලෙන් හෝ පැක්ස් e-mail මගින් අප වෙත එවන්න**




**Children's Corner**

## The First Stamp in Sri Lanka

### ශ්‍රීලංකාවේ තැපැල් ප්‍රථම මුද්දරය




It was 155 years ago, on April 1, 1857 that the first adhesive stamp was issued in Sri Lanka (then Ceylon). The value was 6 pence. (Decimal currency Rupee and Cents was adopted only in 1872) Perkins Bacon & Co Ltd printed this first stamp. It had a purplish colour and the sheet did not have perforations and had to be cut from the sheet.

The stamp carried the left profile of the head of **Queen Victoria**, the ruler of the British Empire who was also Ceylon's monarch and the words **CEYLON** and **SIX PENCE.**

වසර 155 කට පෙර 1857 අප්‍රියෙල් 1 වෙනි දින ප්‍රථම අලවන මුද්දරය ලංකාවේ නිකුත් කෙරිණ. මිළ පැන්ස 6 කි. (රුපියල් සත ලංකාවේ භාවිතයට පැමිණියේ 1872 දීය) මුද්දරයේ වර්ණය ලා දම්පැහැය වූ අතර වෙන් කරන හිල් පේලි නොවූයෙන් කතුරකින් කපාගත යුතු වීය. ලංකාව එංගලන්තයේ යටත් විජිතයක් වූ බැවින් එකල බ්‍රිතාන්‍යය් රජකළ වික්ටෝරියා රැජිණගේ හිසේ රූපයක් ද, සිලෝන් සහ සික්ස් පෙන්ස් යන ඉංග්‍රීසි අකුරුද මුද්දරයේ වීය.

♦ ***Auntie Ramani*** (**රමණි නැන්දා**)

## පුංචි සත්තු

කිචි බිචි කිචි කිචි බිචි කිචි සද්දෙ ඇහෙනවා
අඹ ගහ උඩ ඉඳගෙන උන් සිංදු කියනවා
කෑම පිඟන් දෙකක් අරන් අම්මා එනවා
ගහ අස්සේ හැංගීගෙන ඒව බලනවා

පුංචි ලේන දුවන් ඇවිත් එකක් ගන්නවා
ගිරා පැටිය පියාඹගෙන අත්තෙ වහනවා
කෑම කන්න අනෙක් සත්තු දුවගෙන එනවා
උන් ඔක්කොම සමගි වෙලා ඒවා කනවා

♦ ***ජයනි අකිලා රාජපක්ෂ***
*මහමායා බාලිකා විදුහල, මහනුවර* Sri Lanka


# ලංකා බැංකුව
# BANK OF CEYLON (UK) LTD



**ඔබගේ සියළුම බැංකුකරණ කටයුතු සඳහා විමසන්න !**

- ✔ ඉතිරිකිරීමේ ගිණුම්, ජංගම ගිණුම්, ස්ථාවර තැන්පතු
- ✔ පුද්ගලික ව්‍යාපාරික ණය
- ✔ ශ්‍රීලංකාවට මුදල් යැවීම
- ✔ ආනයන හා අපනයන සේවාවන්
- ✔ විදේශ මුදල් (යුරෝ හා ඇමරිකානු ඩොලර්) හුවමාරුව

අප හරහා ශ්‍රීලංකාවට මුදල් යවන ඔබට සෑම මසකටම වරක් පවුම් 50 බැගින් වූ සුපර්මාර්කට් වවුචර් 3 ක් දිනාගැනීමේ අවස්ථාව....!
මුදල් යවන වාර ගණන වැඩිවන විට දිණුම් අවස්ථා ද වැඩිවේ.
එක්සත් රාජධානියේ ස්වාධීන බැංකුවක් වන අපගේ තැන්පතුකරුවෝ මූල්‍යසේවා වන්දි යෝජනා ක්‍රමය (Financial Services Compensation Scheme) යටතේ £ 85,000 ක් දක්වා තැන්පතු ආරක්ෂණයකට සුදුසුකම් ලබති.

BANK OF CEYLON (UK) LTD
BOC
Gateway to Sri Lanka

1 Devonshire Square, London EC2M 4WD,
Tel: 020 7377 1888 Fax: 020 7377 5430
Email: info@bankofceylon.co.uk Web : www.bankofceylon.co.uk
Nearest Tube: Liverpool Street

(Bank of Ceylon(UK)Ltd is 100% owned by Bank of Ceylon, Sri Lanka)
Bank of Ceylon (UK) Limited is authorised and regulated by the Financial Services Authority
(FSA Referance No: 514744)
Registered in England and Wales(Company Registration No:06736473).
Registered address and Head Office: 1 Devonshire Square,London EC2M 4WD


# එලොව ගිහින් මෙලොව ආ නීල් මෙවර යළි නොඑන්නටම ගියේය!

## හඳට පයතැබූ ප්‍රථම මිනිසා නීල් ආම්ස්ට්‍රෝං මියයයි.

**ඇ**මරිකාවේ ලෝ සුපතළ ගගනගාමියා හෙවත් සඳ මතට ප්‍රථමයෙන් පය තැබූ මිනිසා නීල් ආම්ස්ට්‍රෝං ගිය මස 7 වන දින අවසන් හුස්ම හෙළීය. ඊට සති දෙකකට පෙර ඔහුට සිදු කරනලද බයිපාස් හදවත් සැත්කමකට පසු මතුවූ හෘදය ක්‍රියාකාරීත්වයේ යම් යම් ගැටළු මරණයට හේතු වූ බව පැවසේ. පවුලේ අය විසින් ඔහු වටකරගෙන ඔහුගේ 82 වැනි උපන්දිනය සමරණ ලද්දේ ඊට දින දෙකකට පෙර ය.

ඇමරිකාව විසින් සඳ වෙත යවන ලද ඇපලෝ 11 අජටාකාශ යානය 1969 ජුලි මස 20 වන දින සඳට ළඟා වූ කල්හි එම යාන-යෙන් නික්මී අවුත් සඳමතට පා තැබූ ප්‍රථම මිනිසා වශයෙන් නීල් ආම්ස්ට්‍රෝං ඉතිහාස ගතවෙයි. ඔහු සමග එම යානයේ සිටි අනෙක් ගගනගාමීන් දෙදෙන, එනම් එඩ්වින් ඕල්ඩ්‍රින් සහ මයිකල් කොලින්ස් පසුව සඳට බටහ.

ඉතිහාසයේ ඉන්පෙර නොවූ එම අපූර්වතම සිදුවීමේ පුවත් එදා මුළුමහත් ලෝක ජනතාව විස්මිතව ගුවන්විදුලියෙන් අසා සිටියේ එවකට බොහෝ රටවල රූප වාහිනී නොවූ බැවිනි. අප ඇතුළු සියළු ශ්‍රීලංකාවාසීන් ද එදා දවසම ගුවන් විදුලියට සවන් දෙමින් සිටි හැටි මතකය.

ඇපලෝ යානයේ සිට සඳ මතුපිටට පහත් වූ හිනිමගේ හිනි පෙති එකිනෙකට සීරුවෙන් පය තබමින් පහතට විත් සඳමතට තම පා සටහන් තැබූ නීල් ආම්ස්ට්‍රෝං



එදා මුල්වරට තෙපලූ වචන මෙසේ වෙයි.

"මේ තැබූ අඩිය මිනිසෙකුගේ ඉතා පුංචි අඩියකි....... එහෙත් මෙය සමස්ථ මිනිස් ප්‍රජාවගේ මහා යෝධ පිම්මකි......"

නීල්ගේ එම වචන කීපය ලොව පුරා මිලියන වාරයකට වඩා අවශ්‍ය තන්හි උපුටා දක්වා තිබේ. ඉදිරියට ද එසේ වෙනවා ඇත.

ඇමරිකාවේ ඕහියෝ හි ඉපිද එහිම හැදී වැඩී පාසැල් ගිය නීල් පාසැලේදී විද්‍යාවට සහ ගණිතයට දක්ෂයෙකු වීය. නාවුක හමුදා ශිෂ්‍යත්වයක් ලැබ ඔහු අජටාකාශ ඉන්ජිනේරු විද්‍යාව හදාරා ඉන්ඩියානා සරසවියෙන් උපාධියක් ද සමත් විය. මෝටර් රථ බලපත්‍රයක් ගන්නටත් පෙර ඔහුට ගුවන්යානා පදවන්නට පයිලට් බලපත්‍රයක් ගත හැකි විය. ගුවන් යානා කෙරෙහි වූ ඔහුගේ ඇල්ම ඉමහත්ය



***නීල් එදා සඳට ගොඩබැස්ස දින ගත් ඡායාරූපය***

වියට්නාම් යුද්ධය නිසා ලෝකයෙන් බැණුම් අසමින් රුසියාව සමග සීතල යුද්ධයක පැටලී සිටි ඇමරිකාවට ඇපලෝ 11 සඳ ගමන නිසා ලැබුණේ විශාල ශක්තියකි. තාක්ෂණය අතින් ඇමරිකාව පෙරමුණේ බව ලොව පිළිගත්තේ ය. ඒ නිසා ඇමරිකාව නීල් ඇතුළු සඳගාමීන්ට කළහැකි උපරිම ගෞරව පිදුවාය.

සඳට මුලින්ම පා තැබූ මිනිසා ඔහු වුවද නීල් ඒ ගැන කතාකරන වාටත් අකමැතිවිය. "අයියෝ ඕක ඔච්චර මහ ලොකු දෙයක් නෙවෙයි....." ප්‍රසිද්ධිය නොතකන ඔහු කියයි.

සඳමත ඔහුගේ පා සටහන ගැන කී විට නීල් වරක් කීවේ "ළඟදි දවසක කවුරු හරි ආයිත් එහේ යාවි.... එතකොට අනේ ඒක මකලා දාන්න කියලයි මම කියන්නෙ....." යනුවෙනි. ඇමරිකාවේ ඇතැම් දේශපාලනඥයින් ඔහු සිය පක්ෂයට බඳවා ගන්නට යත්න දැරුවත් ඔහු ඒ ප්‍රතික්ෂෙප කළේය. තමන්ගේ පාඩුවේ සිටිනු මිසක සඳ ගමන ගැන ඔහු උදම් ඇනුවේ නැත. එහෙත් අනාගත පරම්පරාවල් තොරතුරු සොයා විශ්වයේ සැරිසැරීම තමා බලාපොරොත්තු වන බව නිතර කීවේය.

ලෝකයේ වීරයෝ සිටිත් නම් සැබැවින්ම අප ඔහු තැබිය යුත්තේ කොතැනද? අහසේ සඳ පායන හැම දවසකම නීල් ආම්ස්ට්‍රෝං මතකයට එනු අප වලක්වන්නේ කෙසේද?

♦ **කිර්ති**

## Birthday Greetings ! උපන්දින සුබපැතුම් !



**අශේන්ද්‍රි Ashendri Mendis**

Wishing a bright future for our loving daughter Ashendri on her 7 th birthday.

**7 වැනි උපන්දිනය සමරණ ආදරණීය අශේන්ද්‍රි ලොකු දුවට වාසනාවත් අනාගතයකට ආසිරි පතන්නේ අදරැති අම්මා, තාත්තා, සීයා, මාමලා, නැන්දලා සහ පුංචි අම්මා.**